www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

***ලෝසවෙඅ: සසජාශි/සසප යුද්ධ විරෝධී ජාත්‍යන්තර හදිසි සම්මේලනය සම්මේලනයට ඉදිරිපත් කරන ලද ප්‍රාරම්භක සමර්පනයෝ***

# යුද්ධයට එරෙහි ව්‍යාපාරයක් උදෙසා දේශපාලන පදනමක්

**WSWS : ISSE/SEP Emergency Conference Against War**
**Opening remarks to the conference**
**The political foundation for a movement against war**

**ජෝ කේ විසිනි**
**2007 අප්‍රේල් 07**

*ඇමරිකා එක්සත් ජනපදයේ සමාජවාදී සමානතාවය සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) මෙහෙයුම් කමිටුවේ සාමාජිකයෙක් වූ ද ලෝක සමාජවාදී වෙබ් අඩවියේ (ලෝසවෙඅ) ලේඛකයෙක් වූ ද ජෝ කේ සමාජවාදී සමානතාවය සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි)/සමාජවාදී සමානතා පක්ෂය (සසප) විසින් පවත්වනු ලබන යුද්ධ-විරෝධී හදිසි ජාත්‍යන්තර සම්මේලනයට ඉදිරිපත් කල ආරම්භක සමර්පනයන් පහත දැක්වේ. එම සම්මේලනය විසින් සම්මත කරනු ලැබ මෙහි පහත පලකර ඇති යෝජනාව මෙහෙයවුනේ මෙම සමර්පනයන් විසිනි.*

෴

සමාජවාදී සමානතාවය සඳහා ජාත්‍යන්තර ශිෂ්‍ය සම්මේලනයේ ද සමාජවාදී සමානතා පක්ෂයේ ද යුද්ධ-විරෝධී හදිසි ජාත්‍යන්තර සම්මේලනයට මෙහි පැමින සිටින ඔබ සියලු දෙනා සාදරයෙන් පිලිගැනීමට මම කැමැත්තෙමි. ඇමරිකා එක්සත් ජනපදයට පිටතින් මෙහි පැමින සිටින අපගේ මිතුරන් හා සහෝදරවරුන් විශේෂයෙන් ම පිලිගනිමු. කැනඩාවේ විවිධ ප්‍රාන්තවලින් ද ජර්මනියෙන් හා ඕස්ට්‍රේලියාවෙන් ද පැමින සිටින සසජාශි හා සසප සාමාජිකයන් කන්ඩායමක් මෙහි සිටිති. මෙම නියෝජිතයන් මෙහි සිටීම මෙය ජාත්‍යන්තර සම්මේලනයක් ය යන්න ඉස්මතු කර දැක්වීමට ආධාර වේ. අප මෙහි පැමින සිටින්නේ අරටුවෙන් ම ජාත්‍යන්තර වූ ව්‍යාපාරයක් නියෝජනය කිරීමට ය. අප කතාකරන්නේ ද ජාත්‍යන්තර ශ්‍රාවකයකට ය.

මෙහි ප්‍රධාන අර්ථභාරය ද ප්‍රධාන අරමුනු ද පිලිබඳව මා සිතන්නේ කුමක් දැයි සටහන් කරමින් මෙම සම්මේලනය ආරම්භ කිරීමට මම කැමැත්තෙමි. මෙම සති අන්තය අපට ලැබී ඇත්තේ බෙහෙවින් කෙටි කාලයකි; අපට සැලකිල්ලට භාජන කල හැකිව ඇත්තේ සීමිත කරුනු සම්භාරයකි; මතු කල හැක්කේ සීමිත ප්‍රශ්න ගනනාවකි. කෙසේ වෙතත්, ඉරිදා ගතවන විට අප සැලකියයුතු කටයුතු ප්‍රමානයක් ඉටු කර හමාර කරනු ඇතැයි අපේක්ෂා කරමු. විශේෂයෙන්ම ජාත්‍යන්තර කම්කරු පන්තියේ ද ශිෂ්‍ය තරුනයන්ගේ ද යුද්ධයට එරෙහි අලුත් වූ ප්‍රහාරයකට දේශපාලන පදනම සපයන්නා වූ යෝජනාවක් සම්මත කර ගැනීමට අපට හැකි වනු ඇත. දැන් ඔබ සියලු දෙනාම අත මෙම යෝජනාවේ කෙටුම්පතක් තිබෙන අතර, මගේ සමර්පනයන්ගේ අරමුන වන්නේ මෙම යෝජනාව සම්මත කර ගැනීම සඳහා ප්‍රේරනය සැපයීම ය.

මෙම සම්මේලනය අති මහත් අර්ථභාරයක් දරා සිටී. අප මෙහි එක්රැස්ව සිටින්නේ හුදෙක් අප වෙනුවෙන් කතා කර ගැනීමට නොවේ, අප මෙහි රැස්ව සිටින්නේ අධිරාජ්‍යවාදය විසින් ඇති කරනු ලැබ ඇති මහා විලෝපනය පිලිකුලෙන් හා බියෙන් සලකන්නා වූ නැතහොත් යුද්ධයේ හා යුදවාදයේ සෘජු ගොදුරු බවට පත්ව ඇත්තා වූ ලොව පුරා කෝටි, ප්‍රකෝටි සංඛ්‍යාත ජනතාව තුල පවත්නා කෝපයට හා විරුද්ධත්වයට දනුවත් හඬක් සපයා දීමට ය. ජාත්‍යන්තරව පිහිටි දේශපාලන ව්‍යුහයන් ද, සංස්ථාවන් ද තුල ජනකායයේ අවශ්‍යතා හා අදහස් ප්‍රකාශනයක් අත් කර ගනු නොමැති ය. අප මෙහි එක් රැස්ව සිටින්නේ මෙම අවශ්‍යතාවන්ට ප්‍රකාශනයක් ලබා දීම සඳහා ය. යුද්ධය අවසන් කිරීමට සමත් දේශපාලන ක්‍රියා මාර්ගයක් විස්තාරනය කිරීමට ය.

අප මෙම සම්මේලනය පවත්වන්නේ සෝබර අවස්ථාවක ය. අද වන විට ඇමරිකා එක්සත් ජනපදය විසින් ඉරාකය ආක්‍රමනය කිරීමෙන් අවුරුදු 4ක් ගත වී තිබේ. අවුරුදු 4ක් යනු සෑහෙන දීර්ඝ කාල පරිච්ඡේදයකි. එය එක්සත් ජනපදයේ සිවිල් යුද්ධය, පලමු වන ලෝක යුද්ධය, එක්සත් ජනපදය දෙවන ලෝක යුද්ධයට අවතීර්නව ගත කල කාලය සහ කොරියානු යුද්ධය තරම්මැ දීර්ඝ වේ. මේ වනාහි ඉමහත් අර්ථභාරයක් දරන්නා වූ ඓතිහාසික කාල පරිච්ඡේදයකි.

ඔබ ඉදිරියේ ඇති යෝජනාව ඇරඹෙන්නේ මෙම අවසානාවන්ත සංවත්සරය සලකුනු කරමිනි. සෑම සංවත්සරයක් මෙන් ම මෙය ද, පෙරාතු කාල පරිච්ඡේදය තුල සිද්ධ වූයේ කුමක් දැයි කිරා බලමින්, ආක්‍රමනය ද ඉන් ඉක්බිත්ත ද පමනක් නොව එක්සත් ජනපදයේ ද ජාත්‍යන්තරව ද ජනතාව විසින් මෙම යුද්ධය නවතාලීමට දරන ලද ප්‍රයත්නයන් ද ඉන් පාඩම් උකහා ගැනීමට කාලය වන්නේ ය.

2003 මාර්තු 21 දා, ඇමරිකානු මිලිටරිය අනාරක්ෂිත රටකට විරුද්ධව මෘග ප්‍රහාරයක් දියත් කරමින්; ආරම්භක ප්‍රහාරයේ දී ම දහස් ගනනක් මරා දැම්මේ ය. 2003 මාර්තු 22 දා ලෝක සමාජවාදී වෙබ් අඩවිය මෙසේ ලිවී යː "බැග්ඩෑඩයට එරෙහි එක්සත් ජනපද බෝම්බ ප්‍රහාරය" භයංකර, මෘග සහ බියගුලු ප්‍රහාරයකි. එය කරගෙන යනු ලබන්නේ මංකොල්ලකාරී අධිරාජ්‍ය අරමුනු උදෙසා ය. -- අන් සියල්ලටත් වඩා තෙල් සම්පත් අල්ලා ගැනීම සහ පාලනය කිරීම ඉලක්ක කර ගත් එය ඇමරිකානු ජනයාට කිසිදු තර්ජනයක් නොකරන්නා වූ ජනතාවකට එරෙහිව එල්ල කරන ලද්දකි. 2003, මාර්තු 21 වනාහී එක්සත් ජනපද ඉතිහාසයේ අතිශයින්ම ලජ්ජා සහගත වූ දිනයක් සලකුනු කරන දිනයකි.

"භීතියේ හා සන්ත්‍රාසයේ (shock and awe) යයි බුෂ් විසින් නම් කරන ලද ප්‍රහාරයේ" නාසි බ්ලිට්ස්ක්‍රීගයේ නූතන සමානාර්ථයේ - ප්‍රථම දිනයේ දී ම ඉරාක නගර මත, ප්‍රධාන වසයෙන් ම මිලියන පහක වාසය වූ බැග්ඩෑඩ් නගරය මතට මාරක බෝම්බ සහ කෲස් මිසයිල 3,000ක් හෙලන ලදී. යුද්ධයේ ප්‍රාරම්භක අවධියේ දී තමන් ඉරාකය මතට කඩාපාත් කරන්නා වූ විනාශකාරිත්වය පර්සියානු බොක්කේ ප්‍රථම යුද්ධයේ ප්‍රාරම්භක අවධියේ දී හෙලන ලද විනාශකාරී බලය මෙන් දස ගුනයක් වන බව ඇමරිකානු හමුදා නිලධාරින් විසින් ඇඟවුම් කර තිබේ."

මෙය වනාහී මහා සංහාරයේ ආරම්භය පමනක් විය. ගතවූ අවුරුදු හතර ඇතුලත, ඇමරිකානු හමුදාව ඉරාක ජනකාය මත තම පාලනය තහවුරු කර ගැනීමට කරන උත්සාහයේ දී ඇති කරන ලද නිමක් නැති මරන සහ විනාශය අපි දැක ගත්තෙමු; සම්පූර්න නගර බිමට සමතලා කරන අයුරු ද අවසානයක් නැති යටත් විජිතවාදී මර්දනය ද අපි දැක ගත්තෙමු. අබුග්‍රයිබ්හි ම්ලේච්ඡ ක්‍රියා ද, මහා අත් අඩංගුවට ගැනීම් හා වධබන්ධන ද දැක ගත්තෙමු; ආක්‍රමනික හමුදා විසින් උසිගන්වන ලද ආගම්වාදී ප්‍රචන්ඩත්වය දැක ඇත්තෙමු. ඉරාකයෙන් පිටත සිට බලන අපට දැකගත හැකි වූයේ ඇමරිකානු පාලක ප්‍රභූවේ ඉලක්කයන් බවට පත් වූ මනුෂ්‍යයන් මුහුන දුන් භයංකර තත්වයේ ඇසිපිල්ලමක් පමනි. ඇමරිකානු මිලිටරිය විසින් පවත්වා ගෙන යන ප්‍රවෘත්ති වාරනය ද මාධ්‍යයන් විසින් ඊට දෙන සහාය ද විසින් යුද්ධයේ දෛනික විපාකයන් විශාල වසයෙන් වාර්තා නොකොට මග හරිනු ලැබේ.

මෙම යෝජනාවේදී සටහන් කරනු ලැබ ඇත්තේ ඇමරිකානු ආක්‍රමනයේ ප්‍රතිඵලයක් ලෙස 2006 ජූනි වන විට 655,000 දක්වා ඉහල නැගි ඉරාකයේ මරන සංඛ්‍යාව පිලිබඳව පමනි. අද දින වන විට මෙය 750,000 කට වැඩි වනු නිසැක ය. මේ ප්‍රමාන සංඛ්‍යාවක් සංකල්පනය කර ගැනීම අසීරු ය. මෙය වනාහී අත්‍යසාමාන්‍ය පරිමානයක අපරාධයකි. සමහර අවස්ථාවල කෙනෙකු මෙම අපරාධයේ ස්වභාවය අමතක කර නොතකා සිටීමට ඉඩ ඇතැයි මට සිතේ. මිලියනයකින් හතරෙන් තුනක් තරම් ජනතාව මරා දමා ඇති මෙම ක්‍රියාන්විතය මෙහෙයවා ඇත්තේ ඇමරිකානු ජනතාවගේ නමින් කතා කරන බව කියා පාන ඇමරිකානු ආන්ඩුව ය. ඉරාක මරනවලට අමතරව මෙම යුද්ධ ප්‍රයත්නයේ දී ඇමරිකාව හා එහි හවුල් රාජ්‍යවල භටයන් 34,00ක් ද මරනයට පත් වූහ.

මෙම යුද්ධයේ මෘගත්වය වටහා ගැනීම ආරම්භය පමනකි. ඇත්තටම අප මෙහි රැස්ව සිටින්නේ හුදෙක් මෙම යුද්ධයට විරුද්ධත්වය ප්‍රකාශ කිරීමට නොවේ; නැතහොත් එය කොතරම්මැ භයානක ද යන්න පිලිබඳ වාර්තා ඉදිරිපත් කිරීමට හෝ නොවේ; එසේත් නැත හොත් ඇමරිකානු ආන්ඩුව කොතරම් සාපරාධී ආන්ඩුවක් දැයි පෙන්නා දීමෙන් නැවතීමට ද නොවේ. මෙම යුද්ධය වහා අවසන් කල යුතු යයි අප සත්තකින්ම කියා සිටින නමුත් අපේ කටයුත්ත එතැනින් නවතින්නේ නැත.

වඩාත් වැදගත් කාරනය නම් අප මෙහි පැමින සිටින්නේ මෙම යුද්ධය අවසන් කිරීම සඳහා අවශ්‍ය දේශපාලන ක්‍රියා මාර්ගයක් විස්තාරනය කිරීමට ය. ඇත්තටම අපගේ මෙම සම්මේලනය දහස් ගනන් සංවිධාන හා විරෝධතා ප්‍රකාශක කන්ඩායම් විසින් පවත්වනු ලබන විවිධ විරෝධතා ක්‍රියාවලින් වෙනස්වන්නේ අප සම්මේලනයේ ඉහත කී අරමුන විසිනි. පසු ගිය අවුරුදු හතරේ අත් දැකීම් තුලින් අපට උකහා ගත හැකි පාඩමක් ඇතොත් එය වනාහි දේශපාලන සංස්ථාපිතයට ආයාචනය කර සිටීමේ පරිපූර්න නිශ්ඵල භාවයයි. දේශපාලන සංස්ථාපිතය යන වචනයෙන් ඇමරිකාව තුල අඟවනු ලබන්නේ ද්වි පක්ෂ ක්‍රමයයි.

අප ඉරාක යුද්ධයට ද ඇෆ්ඝනිස්ථාන යුද්ධයට ද ඉරානයට එරෙහිව දියත් කිරීමට තර්ජනය කරනු ලබන යුද්ධයට ද ප්‍රතිචාර දක්වීමේ දී අප අපගෙන් ම අසාගත යුතු ප්‍රශ්නය නම් මෙම යුද්ධය වඩාත් ගැඹුරු හේතුවල විපාකයක් නොවේ ද යන්න ය. මෙම යුද්ධ සම්බන්ධයෙන් දී ඇති හේතු සියල්ල බොරු යයි තහවුරු කර ගත් කල්හි, "ඒවායේ සැබෑ හේතුව කුමක් ද?" යන්න අප විසින් ඇසිය යුතුව ඇත. අප ඉදිරියට යා යුතු වන්නේ විද්‍යාත්මකව ය. රෝගයක් සුව කිරීමට

අවශ්‍ය නම් රෝගය ඇති කරනු ලැබුවේ කුමක් විසින් ද යන්න වටහා ගැනීම කල යුතුව ඇත. රෝගයටම ප්‍රතිකාර කල හැක්කේ මේ ආකාරයෙනි. රෝගය හෙලාදැකීම පමනින් එය සුව වනු නැත. යුද්ධයට විරුද්ධ වීම වැදගත් වන අතර මෙම විරෝධය ප්‍රකාශ කිරීම වැදගත් වන අතර සාරභූත ප්‍රශ්නය වන්නේ මෙම විරුද්ධ පක්ෂය මෙහෙයවනු ලබන්නේ කුමන ඉදිරි දර්ශනයකින් ද යන්න යි.

යෝජනාව මුලදීම ඉස්මතු කරන්නේ ඉරාකයේ යුද්ධය අධිරාජ්‍යවාදී යුද්ධයක් බවය. අප අධිරාජ්‍යවාදී යන වචනය යොදාගන්නා කල්හි එය හුදෙක් අවමන් පදයක් නොවේ. එය වනාහී වෛෂයික සමාජ ආර්ථික සන්තතියක් විස්තර කිරීමකි.

ලෙනින් *අධිරාජ්‍යවාදය, ධනවාදයේ ඉහලම අවධිය* යන කෘතිය ලියූ අවධියේ සිට අද දක්වා බොහෝ දේ වෙනස්ව ඇත. එසේ වුවත් සමහර මූලික ලක්ෂන තවමත් පවත්නා අතර ඇත්ත වසයෙන් වඩාත් තියුනු වී තිබේ. අධිරාජ්‍යවාදය යනු ධනවාදයේ ඉහලම අවධියයි. එය වනාහී ධනේශ්වර සමාජයේ පාලක පන්තියේ සමාජ අවශ්‍යතාවන්හි ප්‍රකාශනයකි; එය සම්පත් පාලනය කිරීම ද වෙලඳපොල මත ආධිපත්‍යය තහවුරු කර ගැනීමට ද පාලක පන්තිය විසින් දරනු ලබන ප්‍රයත්නය ය.

ආරම්භයේ දී ම යෝජනාව මෙසේ කියා සිටී, "ඉරාකයට එරෙහි යුද්ධය අධිරාජ්‍යවාදී යුද්ධයකි. එය ඇමරිකා එක්සත් ජනපදයේ සංගත කතිපයාධිකාරයේ ද, බ්‍රිතාන්‍යය සහ තවත් රටවල ද හවුල්කාරයන්ගේ අවශ්‍යතාවන් උදෙසා කෙරෙන ආක්‍රමනික ක්‍රියාවකි. 20 වන ශතවර්ෂයේ ලෝක යුද්ධයන් තුලදී මෙන් දැනුදු සිදුවෙමින් පවතින්නේ ලෝක සම්පත් යලි බෙදාලීම ය, එය මගින් සිදු කරන ලද්දේ එක්සත් ජනපද පාලක පන්තිය විසින් තීරනාත්මක සම්පත් යලි බෙදා ලීමකි."

මේ අර්ථයෙන් ගත් කල්හි යුද්ධය අහම්බයක් නොවේ. එය වනාහි ධනේශ්වර පද්ධතියේ යටින් පවත්නා ප්‍රතිසතිතාවන්හි නිර්මානයකි. යෝජනාව මෙසේ ප්‍රකාශ කරයි, "ප්‍රගාමීව උග්‍රවන්නා වූ නිෂ්පාදනයේ භූගෝලීය ඒකාග්‍රකරනය, ධනේශ්වර පද්ධතිය ඓතිහාසිකව මුල්බැසගෙන ඇති යල්පැනගිය ජාතික රාජ්‍ය පද්ධතියට එරෙහිව ව්‍යසනකාරී ලෙස සට්ටනය වෙයි. මෙම ප්‍රතිසතිතාව එන්න එන්නම පටුවන්නා වූ පාලක පන්තියක් විසින් නිෂ්පාදන බලවේග පෞද්ගලිකව අත් පත් කරගැනීම ද මිලියන සියගනනක් වූ ජනයාගේ ශ්‍රමය අලලා ගත් නිෂ්පාදන සන්තතියේ සමාජමය ස්වභාවය ද අතර මූලික සට්ටනය තව දුරටත් උග්‍ර කර දමයි."

ඉතා වැදගත් යයි මා සිතන හෙයින් එම කාරනය තරමක් විස්තාරනය කිරීමට මට අවසර. ගතවූ දශක ගනනාවක් තිස්සේ ධනවාදය භූගෝලීය ඒකාග්‍රකරනයේ අත්‍යසාමාන්‍ය කාල පරිච්ඡේදයක් තුලින් ගමන් කොට තිබේ. අවුරුදු 150කට පෙර, මාක්ස් සහ එංගල්ස් ධනවාදයේ භූගෝලීය ස්වරූපය ගැන කතා කලේ ය; (කොමියුනිස්ට් ප්‍රකාශනය) "සිය නිෂ්පාදනයන් සඳහා වඩ වඩාත් ප්‍රසාරනය වන වෙලඳපලක අවශ්‍යතාවය විසින් භූගෝලයේ මුලු මහත් වපසරිය පුරාම ධනේශ්වරය ධාවනය කරනු ලබයි. එය සෑම තැනක ම කූඩු තනමින්, පැලපදියම් වෙමින් සෑම තැනක ම සම්බන්ධතා තහවුරු කර ගත යුතු ය."

එදා මෙදා තුර භූගෝලීය ඒකාග්‍ර කරනය අත්‍යසාමාන්‍ය වේගයකින් වර්ධනය වී තිබේ. ජාතික ආර්ථිකයක් යයි කියා දෙයක් තව දුරටත් ඉතුරු වී ඇත්තේ නැත. ප්‍රාග්ධනය ඇද ගැනීම සඳහා ද, නිමි ද්‍රව්‍ය අපනයනය සඳහා ද, තීරනාත්මක අමුද්‍රව්‍ය ආනයනය සඳහා ද තවත් බොහෝ කරුනු උදෙසා ද සෑම ආර්ථිකයක් ම ලෝක වෙලඳපල මත යැපෙයි. තම භාන්ඩ වඩ වඩාත් අඩු වියදමකින් නිෂ්පාදනය කොට ලෝක වෙලඳපල තුල අඩු මිලකට විකිනීම සඳහා තැන් සොයා මහා සංගත ගමන් කිරීම තුලින් නිෂ්පාදන ක්‍රියාවලිය ම ලෝක පරිමාන ස්වභාවයක් අත් කර ගනී. සත්තකින් ම ඇමරිකානු ධනවාදය ද ඒ හා සමග ම ඇමරිකානු පාලක පන්තියේ සමාජතත්වය ද පවත්නේ ගැඹුරින්ම පරායත්ත (අනුන් මත යැපෙන) තත්වයක ය. එයට අයත්ව ඇත්තේ ලෝක වෙලඳපල තුල වඩ වඩාත් දුබල වන ආර්ථික තත්වයකි. යෝජනාව සඳහන් කරන පරිදි "ඇමරිකානු ධනවාදය රඳා තිබෙන්නේ දැවැන්ත ප්‍රාග්ධන ආගලනය ද පෙර නුවූ විරූ නය මට්ටම් ද විවිධාකාර මූල්‍ය සමපේක්ෂනය හා ජාවාරම් ද මත්තේ ය."

වර්තමාන කාල පරිච්ඡේදය එහි ඓතිහාසික සන්දර්භය මත තබතොත් නම් සමහර මූලික ප්‍රවනතාවන් දැක ගත හැකි වේ. දෙවැනි ලෝක යුද්ධයට පසු සමයේ තිබුනු තැන ඇමරිකානු පාලක පන්තියට දැන් නැතිවී ගොස් තිබේ; එහෙත් ඒ සමග බැඳී පැවති කෑදර කම නම් නැතිවී ගොස් නැත.

මේ රටේ ආන්ඩුව ලවා තම අවශ්‍යතා නියෝජනය කරගන්නා වූ ඇමරිකානු පාලක ප්‍රභූවට භූගෝල පරිමාන ධනේශ්වර රාමුව තුල තමන් වැටී ඇති තත්වය ඉදිරියේ ඉතුරුව ඇති එකම ප්‍රතිචාරය නම් මිලිටරි බලය යෙදීම ම පමනි. 2004 මැතිවරන ප්‍රකාශයේ දී සසප සඳහන් කල පරිදි, 'බුෂ් පාලනාධිකාරයේ පූර්ව භංග යුද්ධ න්‍යාය තුලින් සාරභූත ප්‍රකාශනයක් අත් කර ගන්නා වූ ඇමරිකානු ධනවාදයේ ප්‍රචන්ඩ පුපුරා හැලීම විසින් නියෝජනය කෙරෙන්නේ ලෝක ආර්ථිකය සහ ජාතික රාජ්‍යය අතර ප්‍රතිසතිතාවය - එක්සත් ජනපදය නමැති - තනි රාජ්‍යයේ ආධිපත්‍යය අනෙකුත් සිලුම රටවල් මත්තේ පිහිටුවාලීම මගින් විසඳාලීමට දැරෙන ප්‍රයත්නයකි."

යුද්ධය කෙරේ අපගේ ප්‍රතිචාරය පදනම් විය යුත්තේ එයට යටින් පවත්නා පොදු ප්‍රවනතාවන් වටහා ගැනීම මත ය. යුද්ධය ධනේශ්වර පද්ධතියේ නිර්මානයක් නම්, එවිට එය ධනවාදය අහෝසි කර දැමීමෙන් මිස අවසන් කල නොහැකි ය. යෝජනාව ප්‍රකාශ කරන පරිදි "යුද්ධය නිමා කිරීමට ඇති එකම මාවත තිබෙනුයේ සමාජවාදී වැඩ පිලිවෙලක් මත පදනම් වූ ජාත්‍යන්තර කම්කරු පන්තියේ ඒකාබද්ධ දේශපාලන ව්‍යාපාරයක් හරහා ය. ලොව සම්පත් පෞද්ගලික ධනය ගොඩ ගසා ගැනීමට සහ සංගත ලාභයන් වෙනුවෙන් නොව දැවෙන සමාජ අවශ්‍යතා සැපිරීමට භාවිතා කල හැකි වන අයුරු ලොව නිෂ්පාදන සම්පත් ලෝක ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය පාලනය යටතේ තැබිය යුතු ය."

ඔබ ඉදිරියේ ඇති යෝජනාවේ මූලික ඉදිරි දර්ශනය එයයි. මා එහි සෑම විස්තරාංගයක් ම සමාලෝචනය කරන්නේ නැත; යෝජනාව ඉටු කරන්නට උත්සාහ කරන්නේ හැකිතාක් සැකෙවින් භූගෝලීය ධනවාදයේ අර්බුදයේ විවිධ අංශයන් දල වසයෙන් සටහන් කිරීම ය. ඉරාකයට එරෙහි යුද්ධය වනාහී ඇමරිකානු අධිරාජ්‍යවාදයේ භූගෝලීය මූලෝපායේ කොටසක් බව යෝජනාවෙන් පැහැදිලි කෙරේ. ඇමරිකානු පාලක ප්‍රභූව උනන්දුවන්නේ හුදෙක් ඉරාක තෙල් පාලනය කිරීම නොවන බවත්, එය සෑම මහාද්වීපයක ම තම පිලිමල් ධනේශ්වර බලවතුන් යුද්ධමය ක්‍රියා මගින් හෝ වෙනත් ඇඟිලිගැසීම් මගින් අබලන් කොට දැමීමට උත්සුක වේ.

මෙම ප්‍රදේශවලින් කොයි එකක් වුව එක්සත් ජනපදය හා රුසියාව, නැතහොත් එක්සත් ජනපදය හා චීනය, හෝ එක්සත් ජනපදය හා ඒ හෝ මේ යුරෝපීය බලවතා අතර වඩාත් පුලුල් සට්ටනයක් අවුලුවා ලන ගිනි ගැටුම ආරම්භ විය හැකි ය.

ලෝක මිලිටරි ආධිපත්‍යය සඳහා ඇමරිකානු පාලක ප්‍රභූවේ ධාවනය, කලින් කාල පරිච්ඡේදයක ඇමරිකානු කම්කරු පන්තිය විසින් දිනා ගනු ලැබූ කුමන හෝ සහනයක් වුව ආපසු උදුරා ගැනීමට උත්සාහ දරන මහ සංගත හා මූල්‍ය කතිපයාධිකාරය වැඩ කරන ජනතාවට එල්ල කරන ප්‍රහාරය සමග අවියෝජනීය ලෙස බද්ධවී පවතී. ඇදහිය නොහැකි තරමට වැඩී ඇති සමාජ අසමානතාව සහ මිලිටරිවාදයේ පුපුරා හැලීම එකම සන්තතියේ දෙපැත්ත ය.

යෝජනාව තුල ඉදිරිපත් කර තිබෙන සමාජ අසමානතාවය පිලිබඳ සංඛ්‍යාලේඛන අතිශයින්ම අර්ථධාරී ය. ඇමරිකාවේ ජනගහනයෙන් ඉහල ම සියයට එක ලබන්නා වූ ආදායම දුප්පත්ම ඇමරිකානුවන් 150 මිලියනය (15ස් කෝටිය) ලබන්නා වූ මුලු ආදායම ඉක්මවයි. සෑම අවුරුද්දකම අසමානතාවය වඩ වඩාත් උග්‍රවෙයි. මහා අවපාතයට කලින් 1928 කාල පරිච්ඡේදයෙන් පසු කවර විටෙක වත් සමාජ අසමානතාවය මෙතරම් උග්‍රවී තිබී නැත. මහා අවපාතය කෙලින් ම මග පෑදුවේ දැවැන්ත විප්ලවීය පුපුරායාම්, ඇමරිකා එක්සත් ජනපදයේ සහ ජාත්‍යන්තරව පන්ති ප්‍රතිවිරෝධයන් පුපුරා හැලීම් හා යුරෝපයේ ෆැසිස්ට්වාදයේ ද දෙවන ලෝක යුද්ධය නමැති මහා රවුද්‍රයේ ද පැන නැගීම්වලට ය.

අවසාන වසයෙන් මෙම යෝජනාවේ ඇති මවිසින් පරම වසයෙන්ම තීරනාත්මක යයි සලකනු ලබන කරුනු දෙකක් අවධාරනය කිරීමට කැමැත්තෙමි. පලමු වැන්න ජාත්‍යන්තරවාදයයි. ජාත්‍යන්තරවාදය අංශ ගනනාවකින් ම අර්ථභාරී ය. ප්‍රථමයෙන්ම, සකල ලෝකයේ ම ජනතාව ඇමරිකානු අධිරාජ්‍යවාදයේ පුපුරා හැලීමෙන් භයංකර ලෙස තර්ජනයට ලක්ව සිටිති. ලෝකයේ කොතැනක ජීවත් වුවත් ලෝක යුද්ධය පිලිබඳ තර්ජනයට අපි මුහුන දී සිටිමු. දෙවනුව ඇමරිකානු පාලක ප්‍රභූව පමනක් නොවේ අධිරාජ්‍යවාදී බලලෝභයෙන් පෙලඹී ඇත්තේ වැඩෙන සමාජ අසමානතාවෙන් සහ ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එල්ල වූ ප්‍රහාරයන් ගෙන් දෙදරා යන එක ම සමාජය ඇමරිකානු සමාජය නොවේ. සමහර ප්‍රවනතාවයන්ගේ අතිශයින්ම සංකේන්ද්‍රිත ප්‍රකාශනය අපට දැක ගත හැකි වන්නේ ඇමරිකා එක්සත් ජනපදය තුල ය. එහෙත් යෝජනාව පැහැදිලි කරන පරිදි ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට එල්ල කරන ලද ප්‍රහාරය ද, එය මෙන් ම සමාජ අසමානතාවය ද, ජාත්‍යන්තරව ම සිදු වෙයි. සත්තකින්ම, මෙම ප්‍රහාරයන් රටින් රටට ප්‍රතිකරනය වීම ම ඒවායේ හේතුව ඉතා ගැඹුරු ය යන්න පිලිබඳ වැදගත් ම සාධකයන්ගෙන් එකක් වන්නේ ය.

අති මූලික වසයෙන් ගතහොත් ජාත්‍යන්තරවාදය පිලිබඳ පර්යාලෝකය (ඉදිරි දර්ශනය) පැන නගින්නේ ධනේශ්වර ක්‍රමය ම භූගෝලීය පද්ධතියක් වීම තුලිනි. ධනවාදය භූගෝල පරිමාන පද්ධතියකි; එයට විරුද්ධ පක්ෂය ද භූගෝල පරිමානව ඒකාග්‍රිත දේශපාලන ව්‍යාපාරයක් ලෙස ම පැන නගිනු ඇත. ධනේශ්වර පද්ධතියේ භූගෝලීය ස්වභාවය ම එයට ප්‍රතිවිරුද්ධ ජාත්‍යන්තර පන්තියක් ජනනය කොට තිබේ - ඒ ජාත්‍යන්තර කම්කරු පන්තිය ය - එම පන්තියේ වෛෂයික අවශ්‍යතාවෝ ද, ජාතික සීමා ඉක්මවති. නිෂ්පාදන බලවේගයන්ගේ භූගෝලීයකරනයට අපගේ ප්‍රතිචාරය විය යුත්තේ ජාතික දේශසීමා යලි තහවුරු කිරීමේ ප්‍රයත්නය ය යන අදහස අපි ප්‍රතික්ෂේප කරමු. *ලෝක සමාජවාදී වෙබ් අඩවියේදී* අපි යලියලිත් තර්ක කොට ඇති පරිදි ගැටලුව භූගෝලීකරනය නොවේ - සත්තකින් ම මානව සමාජයේ නිෂ්පාදන ධාරිතාව වර්ධනය වීම ලෝකය පුරාම ජනතාවගේ ජීවන තත්වයන්හි වේගවත් වර්ධනයක් සඳහා කොන්දේසි නිර්මානය කර තිබේ. ගැටලුව වන්නේ ජාතික-රාජ්‍ය පද්ධතිය සහ නිෂ්පාදන

බලවේගයන්ගේ පෞද්ගලික අයිතිය දිගින් දිගට ම පැවතීමය. මෙම කොන්දේසි ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයක් මගින් විස්ථාපනය කල යුතුව ඇත.

විශේෂ අවධාරනයක් යොමු කල යුතු යෝජනාවේ දෙවන කොටස නම් කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනතාව පිලිබඳ ප්‍රශ්නයයි. මෙම ප්‍රශ්නය අන් සියල්ලට අන්තර්ගත කරගන්නා හෙයින් සියලු ම ප්‍රශ්න අතර අති මූලික තැනක් ගනී.

යෝජනාව මෙසේ ප්‍රකාශ කරයිඃ "මෙම පිලිවෙත්වලට විරුද්ධ වී යුද්ධය අවසන් කිරීමට හැකි බලවේගයක් තිබේ. ඒ ලෝක ජනගහනයෙන් අති මහත් බහුතරය වන ජාත්‍යන්තර කම්කරු පන්තිය ය. සිය සමාජ උවමනාකම් අධිරාජ්‍යවාදය යටින් පවතින සමාජ උවමනාවන්ට සමහන් කල නොහැකි ලෙස එරෙහි වන, ජනතාවගේ එකම කොටස කම්කරු පන්තිය යි. එසේම කම්කරු පන්තිය, සිය සමාජ උවමනාවන් තරගකාරී ජාතික රාජ්‍යයන්ගේ ධනපති පද්ධතියේ කොටු පවුරු හරහා ගමන් කරන එකම අව්‍යාජ ජාත්‍යන්තර පන්තිය ය." කම්කරු පන්තියේ වෛෂයික අවශ්‍යතාවෝ සූරාකෑමේ ධනේශ්වර පද්ධතියට ප්‍රතිවිරුද්ධව පිහිටා පවතිත්. ධනවාදයට එරෙහි ව්‍යාපාරයට පදනම් වීගත හැක්කේ මෙම වෛෂයික අවශ්‍යතා මත පමනි.

ඇමරිකා එක්සත් ජනපදය තුල කම්කරු පන්තියේ පන්ති ස්වාධීනත්වය සඳහා අරගලය ඩිමොක්‍රැටික් පක්ෂයට ද එම පක්ෂයට බලපෑම් දෑමීම ඒ හෝ මේ ආකාරයෙන් තම යොමුව ලෙස ගන්නා වූ සියලුම සංවිධාන හා සංස්ථාවන්ට ද එරෙහිව ස්ථිරසාර අරගලයක් ඉල්ලා සිටී. මෙම සම්මේලනය පැවැත්වෙන්නේ ඉරාකයේ යුද්ධය පිලිබඳව කොංග්‍රසය තුල විවාදයක් පවතිමින් තිබෙන තත්වයක් තුල ය. මාධ්‍යයන් විසින් මෙම විවාදය දක්වා තිබෙන්නේ බුෂ් පාලනාධිකාරයේ දෑඩි විරුද්ධත්වය ඉදිරියේ යුද්ධය අවසන් කරලීම උදෙසා ඩිමොක්‍රැටික් පක්ෂය විසින් කරගෙන යනු ලබන උදාර අරගලයක් ලෙස ය. මෙය පරිපූර්න වංචාවකි. *ලෝසවෙඅභි* අප අවධාරනය කර ඇති පරිදි රිපබ්ලිකානුවන් ද ඩිමොක්‍රැටිකයන් ද අතර භේදයන් වනාහී ස්වභාවයෙන්ම උපායික වූ ඒවා ය. මහජනතාව යුද්ධයට දක්වන විරුද්ධත්වය ද්වි-පක්ෂ ක්‍රමය තුල කුමන කොටසක් තුල හෝ ප්‍රකාශිතව ඇත්තේ නැත.

මෑතක දී පුවත්පත්වල පලවූ ලිපි ගනනාවක් ම මෙම කාරනයට සාක්ෂ්‍යවේ. උදාහරනයක් හැටියට මාර්තු 29 දින *නිව් යෝර්ක් ටයිම්ස්* පුවත්පත් කතුවැකිය මෙසේ ප්‍රකාශ කරයි. "යුද්ධය දිනන්නට උවමනා අයත් යුද්ධයෙන් පරදින්නට උවමනා අයත් අතර වාදයක් කෙරීගෙන යන බවක් ඇමරිකානුවන් ලවා සිතවීම ඉලක්ක කර ගත් ප්‍රචාරක වලාකුලක් බුෂ් මහතා ද කැපිටෝල් හිල් හි (ඇමරිකානු මන්ත්‍රීමන්ඩල මධ්‍යස්ථානයේ) ඔහුගේ ආධාරකරුවන් ද ඔහුගේ උපදේශකයන් ද විසින් අවුස්සා දමා තිබේ. මෙය අර්ථ රහිත කතාවකි. ධවල මන්දිරය මෙය දැන සිටී. බුෂ් මහතාගේ නොපොහොනා ප්‍රතිචාරය වනාහී බහුතරය සමග ඡන්දය පාවිච්චි කල ඩිමොක්‍රැටික් පාක්ෂිකයන් ද මධ්‍යස්ථ මතධාරී රිපබ්ලිකානුවන් ද ඉරාකයේ දේශපාලන අනාගතය හා එහි රඳවා සිටින ඇමරිකානු භටයන්ගේ චිත්ත ධෛර්යය ද නොතකන්නන් ලෙස පෙන්වා දීමට දරන ලද්දා වූ නරුම ප්‍රයත්නයකි. සත්‍ය වසයෙන්ම ගතහොත් මෙම දෙඅංශයෙන් ම තම වගකීම් පැහැර හැර සිටින්නේ බුෂ් මහතා ම ය. දැන් ඔහු ඔතරම්ම දරුනු ලෙස විරුද්ධත්වය දක්වන භාෂාවෙන් ඔහුට කතා කිරීමට කොංග්‍රසයට සිදු වී ඇත්තේ ඒ නිසා ය."

වෙනත් වචනවලින් කිවහොත් බුෂ් පාලනාධිකාරය මෙන් ම ඩිමොක්‍රැටිකයෝ ද ඉරාකයේ දී 'සාර්ථකත්වය' පතා සිටිති - එහෙත් එය අත් කර ගත හැක්කේ කෙසේ ද යන්න ගැන ඔවුන් දරන්නේ වෙනත් අදහස් ය. 2008 ජනාධිපති තරගකරුවන් අතර මුල් තැන ගන්නා සෙනෙට් සභික හිලරි ක්ලින්ටන් ගේ ආස්ථානයන් විස්තර කරන ලිපි ගනනාවක් *නිව් යෝර්ක් ටයිම්ස්* පුවත්පතේ පලවී තිබුනි. වඩාත් මෑත මාර්තු 27 වන දින දී "අතීතය ගැන සිහි ඇතිව, ක්ලින්ටන් යුද හමුදාව මිතුරා කරගනී" යන ලිපිය පල විය.

මෙම ලිපියේ දී *ටයිම්ස්* පත්‍රය පෙන්නුම් කරන කරුනක් නම් ක්ලින්ටන් ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරින් සමග සමීප සබඳතා ඇති කර ගැනීමට යත්න දරා ඇතැයි යන්න ය. මේ පිලිබඳව විශ්‍රාම ගිය ජෙනරාල්වරයෙකු ද හමුදාවේ හිටපු උප මාන්ඩලික ප්‍රධානියෙකු ද වූ ජැක් කීත් මෙසේ කීවේ යයි එහිදී දක්වේඃ

"ධවල මන්දිරයේ අට වසරක් ද ලෝකය පුරා කරන ගමන්වල දී ඇමරිකානු හමුදාව සිය ජාතියේ අරමුනු ඉෂ්ට කිරීමට කරගෙන යන කටයුතු නිරීක්ෂනය කිරීමට ලැබීම ද, දැන් ඈ සෙනේට් මන්ත්‍රී මන්ඩලය තුල ගත කර ඇති කාලය ද ඇයට, ඇයගේ සැමියා ධවලමන්දිරයේ දී නොතිබුනු තරමක - හමුදාවේ කටයුතු පිලිබඳ බරපතල ඇගයීමක් හිලරි ක්ලින්ටන් ට ලැබී තිබේ යයි මම සිතමි."

මෙහි දී සැලකිය යුතු කරුනක් කම් 'කීන් සර්ජ්' යයි නම් කරන ලද යුද්ධය උග්‍ර කිරීමේ උපායට දෑඩිසේ පක්ෂපාතී උපදේශකයෙක් වූ බව ද මෙම මූලෝපාය වර්ධනය කිරීමේ දී බුෂ් පාලනය පැවැත් වූ සාකච්ඡාවලට ඔහු දෑඩිසේ සම්බන්ධ වූ බව ද වේ. *නිව් යෝර්ක් ටයිම්ස්* පත්‍රය කියා සිටින්නේ ඔහු "සෙනේට් මන්ත්‍රීනී (ක්ලින්ටන්ට) සමීප බවය.

කලින් ක්ලින්ටන් පැහැදිලි කර ඇති කරුනක් නම් සෙනේට් සභාවේ ද නියෝජිත මන්ත්‍රී මන්ඩලයේ ද ඉදිරිපත් කරනු ලබන යෝජනාවක් ඉරාකය යටත් කරගෙන සිටීම අවසන් කිරීමට කිසි සේත් ම යොමුව නැති බවයි. එක්සත් ජනපදයේ ආන්ඩුව කරගෙන යන්නේ කුමන පක්ෂයක් වුව ද දස දහස් ගනන් ඇමරිකානු භටයන් ඉරාකය අල්ලාගෙන සිටිනු ඇත. ඩිමොක්‍රැටිකයන්ගේ විරෝධය යුද්ධය හෝ එහි අරමුන නොවේ. ඔවුන්ගේ විරෝධයට පාත්‍ර වී ඇත්තේ බුෂ් පාලනාධිකාරයේ පිලිවෙත මැද පෙරදිග ඇමරිකානු අධිරාජ්‍යවාදයේ අවශ්‍යතාවන්ට ව්‍යසනයක් අත් පත් කොට දී ඇති බව ය.

එක්සත් ජනපදයේ ඩිමොක්‍රැටික් පක්ෂයට ද ජාත්‍යන්තරව එවන් සංවිධානයන්ට ද අපගේ විරෝධය ස්වාභාවිකවම ගලා එන්නේ යුද්ධයේ ස්වභාවයද ධනේශ්වර පද්ධතියේ පොදු ගති ලක්ෂනයන් ද පිලිබඳ අපගේ වැටහීමෙනි. ඩිමොක්‍රැටික් පක්ෂය ධනවාදය ආරක්ෂා කරයි. එය වනාහී ඇමරිකානු අධිරාජ්‍යවාදයේ අවශ්‍යතාවන් ආරක්ෂා කරන්නාවූ ධනේශ්වර පක්ෂයකි. ඩිමොක්‍රැටිකයන්ට බලපෑම් දැමීමේ ඉදිරිදර්ශනය බංකොලොත් වන්නේ ඒ මෙන්න මේ කාරනය නිසා ම ය.

කම්කරු පන්තියේ පන්ති ස්වාධීනත්වය සඳහා සටන් කිරීම වනාහී හුදෙක් ඩිමොක්‍රැටික් පක්ෂය පිලිබඳ මිථ්‍යාවන්ට විරුද්ධ වීම පිලිබඳ ප්‍රශ්නයක් පමනක් නොවේ. ඒ හෝ මේ ආකාරයට දේශපාලන සංස්ථාපිතයට රුකුල් සපයන සියලු ම ප්‍රවනතාවයන්ට එරෙහි වීම අත්‍යවශ්‍යය. කම්කරු පන්තියේ පන්ති ස්වාධීනත්වය උදෙසා සටන් කිරීම අපගේ දේශපාලන ප්‍රවනතාවය වූ හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව, අනෙකුත් සමාජවාදී යයි කියාගන්නා සකල සංවිධානයන්ගෙන් ම වෙන් කොට ස්ථාපන කල සාධකය යි.

සමාප්ත කිරීම් වස් සමාජවාදී සමානතාවය සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ පිලිබඳව ද මෙම සම්මේලනයේ පසුබිම පිලිබඳව ද කෙටි සමර්පනයන් කිහිපයක් කිරීමට මම කැමැත්තෙමි. මෙම සම්මේලනය සඳහා සැලසුම් මුලින්ම පැන නැංගේ සසජාශි මෙහෙයුම් කමිටුව එක්සත් ජනපදයේ නොවැම්බර් මැතිවරනයට පිහිටුවා ගන්නා ලද මන්ඩලයක රැස්වීමක දී ය. එම මැතිවරනයේ දී (ඡන්ද දායකයන් විසින්) ඉරාකයේ යුද්ධය දැවැන්ත ලෙස ප්‍රතික්ෂේප කරනු ලැබීමේ ගම්‍යයන් ද ශක්‍ය ප්‍රතිවිපාකයන් ද යුද්ධය කෙරේ මහජන විරෝධයේ ගැඹුර ද අතර ප්‍රතිසතිතාවය සසපය විසින් සැලකිල්ලට භාජන කරන ලදී. අපගේ විශ්ලේෂනයේ දී අප අවධාරනය කලේ බුෂ් යුද්ධය කරගෙන යන ආකාරය පිලිබඳව ඔවුන් කරන විවේචන තිබිය දී ම ඩිමොක්‍රැටික් පක්ෂය ඉරාකයේ, මැදපෙරදිග සහ මධ්‍යම ආසියාවේ දී ඇමරිකානු පාලක ප්‍රභූවේ මූල්‍ය හා මූලෝපායික අවශ්‍යතාවන් ආරක්ෂා කිරීමට කැප වී සිටි බවය. මෙම හේතු නිසා යුද්ධයට එරෙහිව වැඩෙන්නා වූ ජනතා ව්‍යාපාරයේ අරමුනු කිසි සේත් ම කොංග්‍රසය හා ද්විපක්ෂ ක්‍රමය යන දේශපාලන රාමුව තුල සාක්ෂාත් කර ගැනීමට කල නොහැකි වන බව ද සාක්ෂාත් කර ගන්නේ නැති බව ද පැහැදිලි ය.

මේවා ජාතික ප්‍රශ්න නොවේ. අප මුහුන දී සිටින්නා වූ එකම දේශපාලන ප්‍රශ්නයක් හෝ ජාතික ප්‍රශ්න නොවේ. දේශපාලන තත්වයේ වර්ධනය සලකා බැලීමේ දී සරසවිවල වැඩෙන විරෝධතා හැඟීම ලෝකයේ වඩාත් පුලුල් දේශපාලන ප්‍රවනතාවයන්ගේ වැදගත් අංශයක් වනු ඇතැයි අපි වටහා ගතිමු. එහෙයින් පාසල්වල ද සරසවිවල ද බලගතු ලෙස මැදිහත් වීම අවශ්‍ය බව අපි තීන්දු කලෙමු. අප සමාජ සමානතාවය සඳහා ශිෂ්‍යයෝ යන නමේ සිට සමාජවාදී සමානතාවය සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ යන නමට මාරු වූයේ ජාත්‍යන්තරව ශිෂ්‍යයන් තුලට ගෙන යන්නා වූ පර්යාලෝකය (ඉදිරි දර්ශනය) වඩාත් තීක්ෂනව සංග්‍රහ කොට ඉදිරිපත් කිරීම සඳහා ය.

අපගේ අරමුනු මොනවා ද? සරසවි තුල දේශපාලන වසයෙන් උගත් ශිෂ්‍යයන් ස්තරයක් වර්ධනය කිරීම අපි ඉලක්ක කර ගතිමු. අප උත්සාහ කරන්නේ යුද්ධයට එරෙහි අරගලය ජාත්‍යන්තර සමාජවාදී ඉදිරිදර්ශනයක කොටසක් විය යුතු යයි වටහා ගන්නා තරුනයින් කන්ඩායමක් වර්ධනය කිරීමට ය.

මෙම හේතුව නිසා අපි සසජාශි මෙහෙයුම් කමිටුවේ ප්‍රකාශනයේ පහත සඳහන් ඡේදය ඇතුලු කලෙමු. "සසජාශි අරමුන වන්නේ පලල් ශිෂ්‍ය ශ්‍රාවකයක් කරා ලඟා වීම ය. එහෙත් ඉන් අදහස් වන්නේ දියාරු විරෝධතා ව්‍යාපාරයක් ගොඩනැගීම නොවේ. සමාජවාදී විප්ලවවාදී ජාත්‍යන්තරවාදය, සරසවිවල පවත්නා රැඩිකල් කන්ඩායම්වල දේශපාලනයෙන් වෙන් කොට ගැනීමට අරගලයක් සසජාශි විසින් කල යුතුව ඇත. මෙම කන්ඩායම්වලට ප්‍රතිකූලව සසජාශි තම ආයාචනය පැහැදිලි දේශපාලන ඉදිරිදර්ශනයක් මත පදනම් කර ගත යුතු ය. සසජාශි වෙනම තරුන ශිෂ්‍යයන් අතර වඩාත් දියුනු හා දැනුවත් කොටස් ආකර්ශනය කර ගැනීමට සමර්ථ වනවා ඇත්තේ ඒ ආකාරයට ය." මේ සම්මේලනය එම ඉදිරි දර්ශනයේ නිෂ්පාදනයකි, එම ඉදිරිදර්ශනයේ ප්‍රානවත් බවේ ප්‍රකාශනයකි.

අප මේ සම්මේලනයේ දී සම්මත කර ගැනීමට අපේක්ෂා කරන යෝජනාව වනාහී අධිරාජ්‍යවාදී යුද්ධය අවසන් කිරීමට දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගීමට අප උත්සාහ කරන අතර ම ඉදිරියට ගෙනයාහැකි ලේඛනයකි. එය වනාහී ලෝකය පුරාම දස දහස් සංඛ්‍යාත ජනයා විසින් කියවනු ලබනු ඇති ලියවිල්ලකි. මෙම සාකච්ඡාවේ නිෂ්පාදනය මේ සති අන්තයේ දී

අතට ගෙන එය තුල පවත්නා ඉදිරි දර්ශනය සඳහා සටන් වැදිය යුතු ය.

සහෝදරවරුනි; මා කලින් ඇරඹූ තැනට යලිත් ඒමට කැමැත්තෙමි. - එනම් මේ සම්මේලනයේ අර්ථභාරයට ය.

ඇමරිකානුවන් විසින් ඉරාකය අල්ලා ගැනීම, ආන්ඩුවල දූෂනය හා අපරාධකාරී බව ජාත්‍යන්තරව වැඩෙන සමාජ අසමානතාවයේ බලපෑම යන සාධක ගනනාවකම ඒකාබද්ධතාවය නිසා දේශපාලන කලබැගෑනියේ කාල පරිච්ඡේදයකට අප ඇතුලු වෙමින් සිටින බවට බොහෝ ලකුනු පවතී. මේ සියලුම වර්ධනයන්ට යටින් පවතින්නේ ධනේශ්වර ක්‍රමයේ ම අර්බුදය ය. ජාත්‍යන්තරව මහා ජනකායන් දේශපාලන ජීවිතයට ප්‍රවිෂ්ට වන තතු තුල ඉතා දූනුවත්ව නව දේශපාලන බලවේගයන්ගේ පෙල ගැස්මක් අප ආරම්භ කල යුතුය.

මෙම දේශපාලන තත්වය තුල අපි ජාත්‍යන්තරව කම්කරු පන්තිය නියෝජනය කරමු. මෙයයි අපේ භූමිකාව අප මෙම වැටහීම මත දූනුවත්ව පදනම්වී ගත යුත්තෙමු. දේශපාලන සංස්ථාපිතයේ මොනම ආයතනයක් වත් කම්කරු පන්තියේ අවශ්‍යතා වෙනුවෙන් වෛෂයිකව පෙනීසිටින්නේ නැත. මෙම සති අන්තයේ අපගේ නිගමන සරසවිවල ද කම්කරු පන්තිය තුල ද අපගේ වැඩ කටයුතු වඩාත් පලල්ව කරගෙන යාම සඳහා ශක්තිමත් පදනමක් අත්වනු ඇතැයි ද ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයේ වර්ධනයේ නව අවධියක් අප එමගින් අරඹනු ඇතැයි ද මම අපේක්ෂා කරමි.

© www.wsws.org